14690

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2015
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 07 | විෂයය / பாடம் / Subject ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper I, II | කාලය / காலம் / Time පැය 02 |

නම :- ........................................ විභාග අංකය :- ....................

සැලකිය යුතුයි:

- I කොටසේ ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

## I කොටස

(01) ඊජිප්තුව (මිසරය) මුල්කරගෙන බිහිවූ ගංගා නිම්න ශිෂ්ටාචාරය කුමක් ද?

(1) යුප්‍රටීස් - ටයිග්‍රිස් නිම්න ශිෂ්ටාචාරයයි. (2) නයිල් නිම්න ශිෂ්ටාචාරයයි.
(3) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයයි. (4) හොවැංහෝ නිම්න ශිෂ්ටාචාරයයි.

(02) සියලුම ගංගා නිම්න ශිෂ්ටාචාරයන්හි ආර්ථික කටයුතුවල දක්නට ලැබෙන පොදු ලක්ෂණ දෙකක් වන්නේ,

(1) කෘෂිකර්මාන්තය හා වෙළෙඳාම පැවතීමයි. (2) සත්ව පාලනය හා වෙළෙඳාමයි.
(3) විදේශ වෙළෙඳාම හා ප්‍රතිමා නෙළීමයි. (4) ධාන්‍ය වගාව හා බදු අයකර ගැනීමයි.

(03) ග්‍රීක ජාතිකයන් ශ්‍රී ලංකාව හඳුන්වනු ලැබුවේ කවර නමකින් ද?

(1) සෙරන්ඩිබ් යනුවෙනි. (2) තැප්‍රබානා යනුවෙනි.
(3) සෙයිලාඕ යනුවෙනි. (4) සිලෝන් යනුවෙනි.

(04) ජලෝත්පීඩනය පිළිබඳ න්‍යාය ඉදිරිපත් කරමින් ගණිතය පිළිබඳව නව සොයා ගැනීම් කළ ග්‍රීක පඬිවරයා වූයේ,

(1) හිප්‍රොක්‍රටීස් ය. (2) ආකිමිඩීස් ය. (3) ඇරිස්ටෝටල් ය. (4) යුක්ලිඩ් ය.

(05) - නයිල් ගඟේ මුවදොර ඇලෙක්සැන්ඩ්‍රියා නගරය පිහිටුවීම
- ග්‍රීසිය ප්‍රථම වතාවට එක්සත් කිරීම

ඉහත සිදුවීම් හා සම්බන්ධ ග්‍රීක පාලකයා වන්නේ,

(1) මැසිඩෝනියාවේ පිලිප් රජු ය. (2) මහා ඇලෙක්සැන්ඩර් අධිරාජ්‍යයා ය.
(3) සෙලියුකස් නිකේටර් අධිරාජ්‍යයා ය. (4) ඇරිස්ටෝටල් නම් දාර්ශනිකයා ය.

(06) කිතුදහම වැළඳගත් පළමු රෝම අධිරාජ්‍යයා,

(1) මහා කොන්ස්ටන්ටයින් ය. (2) ජූලියස් සීසර් ය.
(3) ඔගස්ටස් සීසර් ය. (4) නීරෝ ය.

(07) සොළොස් මහා ජනපද හා ඒවායේ අගනගරයන් අතුරෙන් නිවැරදිව ගළපා ඇති වරණය තෝරන්න.

1. අංග - සැවැත්නුවර
2. මගධ - රජගහනුවර
3. කාසි - බරණැස
4. කෝසල - චම්පා

(1) 1 (2) 2 (3) 3 (4) 4

(08) අනුරාධපුර රාජධානිය බිඳ වැටීමට තුඩුදුන් ආසන්නතම හේතුව ලෙස සැළකෙන්නේ,

(1) පස්වන මිහිඳු රජුගේ කාලයේ එල්ල වූ පළමුවන රාජ රාජගේ ආක්‍රමණයයි.
(2) දුර්වල පාලකයන් බලයට පත්වීමයි.
(3) දකුණු ඉන්දීය ආක්‍රමණ නිසා වාරි පද්ධතිය බිඳ වැටීමයි.
(4) රජවරුන් අතර පැවැති අභ්‍යන්තර ආරවුල් ය.


(09) බෙංගාල කවාටය සොළී විලක් බවට පත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාව ආක්‍රමණය කළ දකුණු ඉන්දියානු පාලකයා,

(1) ශ්‍රී මාර ශ්‍රී වල්ලභ ය. (2) පළමුවන රාජ රාජ ය.
(3) පළමුවන පරන්තක රජු ය. (4) කරිකාලන් ය.

(10) පනාකඩුව තඹ සන්නසේ සඳහන් වන පරිදි ළමා කාලය ඉතා දුකසේ ගෙවමින් තම අරමුණ ඉටුකොට ගැනීමට උත්සාහවන්තව කටයුතු කළ රජතුමා වන්නේ,

(1) පස්වන මිහිඳු රජු ය. (2) නිශ්ශංකමල්ල රජු ය.
(3) මහා පරාක්‍රමබාහු රජු ය. (4) පළමුවන විජයබාහු රජු ය.

• දී ඇති ලංකා සිතියම ඇසුරෙන් පිළිතුරු සපයන්න.




(11) මලය රට හා රුහුණු දේශය නිවැරදිව දැක්වෙන අක්ෂර යුගලය

(1) A හා B ය. (2) A හා D ය.
(3) A හා C ය. (4) B හා C ය.

(12) D අක්ෂරයෙන් දැක්වෙන්නේ,

(1) දක්ඛිණ දේශය යි. (2) රුහුණ යි.
(3) මලය රට යි. (4) රජරට යි.

(13) කිසිදිනක රජ නොවූ, එහෙත් පොළොන්නරු රාජධානි සමයේ රාජ්‍ය බලයට විශාල අභියෝගයක් කළ කාන්තාව,

(1) මිත්තා කුමරියයි. (2) අනුලා දේවියයි.
(3) කල්‍යාණවතී රැජිණයි. (4) සුගලා දේවියයි.

(14) පොළොන්නරු රාජධානිය බිඳවැටීමෙන් පසුව ප්‍රාදේශීයව ආරක්ෂිත ප්‍රදේශ තෝරාගෙන පාලනය කළ නායකයන් දෙදෙනෙකු පහත දැක්වේ. ඔවුන්ගේ පාලන ප්‍රදේශ නිවැරදිව දක්වෙන පිළිතුර තෝරන්න.

- සුභ සෙන්පති - සංඛ සෙන්පති

(1) යාපහුව - මිනිපේ (2) යාපහුව - ගෝවින්ද මලය

(3) යාපහුව - දඹදෙණිය (4) දඹදෙණිය - මිනිපේ

(15) රයිගම පාලනය කළ වීර අලකේශ්වර පරාජය කොට ඔහු සිරකරුවකු ලෙස චීනයට රැගෙන ගිය සෙන්පතියා,

(1) චෙං හෝ ය. (2) යුංලෝ ය. (3) ඉබන් බතූතා ය. (4) ඉත් - සිං ය.

(16) - මොවුන්ගේ ප්‍රධාන ආහාරය රටඉඳි හා මස් ය.
- ඇඳුම් අතර වඩා ජනප්‍රිය කපුපිළී ය.
- ඔවුහු දිගු කබායක් ඇඳ හිණ වටා බඳ පටියක් බැන්දහ.

ඉහතින් විස්තර වන්නේ කුමන ජාතිකයන් පිළිබඳව ද?

(1) ග්‍රීකවරුන් ය. (2) රෝමවරුන් ය. (3) අරාබිවරුන් ය. (4) ආර්‍යයන් ය.

(17) ඈත අතීතයේ පටන්ම අරාබිවරු වෙළෙදාම සම්බන්ධයෙන් ප්‍රසිද්ධ වීමට බලපෑ ප්‍රධානතම සාධකය වන්නේ,

(1) අරාබි රටවල වෙළෙඳ ද්‍රව්‍ය වැඩිපුර තිබීමයි.
(2) කෘෂිකාර්මික කටයුතු සඳහා හිතකර පරිසරයක් නොතිබීමයි.
(3) අරාබිවරුන් සතුව විශාල වෙළෙඳ අධිරාජ්‍යයක් පැවැතීමයි.
(4) වෙළෙද ද්‍රව්‍ය සොයා රට රටවලට ගමන්කිරීමට ඔවුන් දැක්වූ රුචිකත්වයයි.

(18) පැරණි භාරතීය සමාජයේ චතුර්වර්ණවලට අයත් කාර්යයන් අතර සියලු කුලවලට මෙහෙවර කළ යුතු වූයේ,

(1) බ්‍රාහ්මණ කුලයේ අයටයි. (2) ක්ෂත්‍රිය කුලයේ අයටයි.

(3) වෛශ්‍ය කුලයේ අයටයි. (4) ශුද්‍රයින්ටයි.

(19) දකුණු ඉන්දියාවේ උතුරේ වූ පාලර් නදියටත් දකුණේ වූ ක්‍රිෂ්ණ නදියත් අතර විශාල ප්‍රදේශයක ගොඩ නැගුනු රාජ්‍යය,

(1) පල්ලව රාජ්‍යයයි. (2) චෝල රාජ්‍යයයි.

(3) කේරල රාජ්‍යයයි. (4) පාණ්ඩ්‍ය රාජ්‍යයයි.

(20) යාල්පාන වෛපවමාලෙ නම් කෘතියේ සඳහන් වන අන්දමට යාපන රාජ්‍යයේ ආරම්භක රජතුමා වූයේ,

(1) පරරාජ සේකරම් රජු ය. (2) විජය කුලංකෙ රජු ය.

(3) වරෝදය රජු ය. (4) සංකිලි රජු ය.

## II කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 5කි.

(01) 7 වන ශ්‍රේණියේ ඉගෙන ගන්නා ඔබ තෙවන පාසල් වාරයේ දී පාසල පදනම් කරගත් ඇගයීම් යටතේ සිදු කළ ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන මතකයට ගනිමින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) ඔබ විසින් ප්‍රශ්න සකසන ලද මාතෘකාවක් නම් කරන්න. (ලකුණු 02)

(2) ප්‍රශ්න සකසන ආකාරය පිළිබඳව ගුරුතුමිය ඔබට ලබා දුන් උපදෙස් දෙකක් ලියන්න. (ලකුණු 02)

(3) මෙම වැඩසටහන පැවැත්වීමට ඔබ හා ඔබේ පන්තියේ සිසුන් සංවිධානය වූ ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(4) මෙම වැඩසටහන සාර්ථක කර ගැනීමට ඔබ සහ ඔබේ පන්තියේ සිසුන් දැක්වූ සහයෝගය කෙබඳුවී දැයි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(5) මෙවැනි ඇගයීම් තුළින් පාඩම්වල විෂයය කරුණු මැනවින් මතකයට නගා ගැනීමට හැකි ය. මේ පිළිබඳව ඔබේ අදහස් කෙටියෙන් ලියන්න. (ලකුණු 04)

(02) (1) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් ප්‍රධාන නගර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) ඉන්දු නිම්නයේ බිහිවූ ශිෂ්ටාචාරය ක්‍රමයෙන් නාගරීකරණය වූ බවට පෙන්වන සාධක හතරක් ලියන්න. (ලකුණු 04)

(3) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ආර්ථික තත්ත්වය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(03) (1) බුදු දහම හැරුණු විට ඉන්දියාවේ පැතිර තිබූ වෙනත් ආගම් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) ලිච්ඡවී පාලන ක්‍රමය තුළින් අපට ලබාගත හැකි ආදර්ශයන් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(3) සොළොස් මහා ජනපද අතර මගධ අධිරාජ්‍යය සෙසු ජනපද අභිබවා බලවත් වීමට හේතු වූ කරුණු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(04) (1) ඉස්ලාම් ධර්මය අදහන අය අතිශය වැදගත් කොට සලකන "හජ්රා" නමින් හැඳින්වෙන්නේ කුමක් ද? (ලකුණු 02)

(2) අරාබි ජාතිකයන් වෙළඳ සබඳතා පැවැත්වූ රටවල් දෙකක් හා ඔවුන් මෙරටින් ගෙන ගිය වෙළඳ ද්‍රව්‍ය දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(3) අරාබිවරුන්ගේ ජන ජීවිතය පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

14690

(05) (1) ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය හා කෘෂිකාර්මික කටයුතුවල දියුණුතම අවස්ථාවට පත්ව තිබුණු අවධියේ,

a. මෙරට සිටි පාලකයා

b. එකල ලංකාවට භාවිතා කළ අන්වර්ථ නාමය (ලකුණු 02)

(2) පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට හේතු වූ කරුණු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(3) පළමුවන පරාක්‍රමබාහු රජතුමාගේ විදේශ සබඳතාවල කැපී පෙනෙන ලක්ෂණ දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(06) (1) කෝට්ටේ රාජ්‍යයේ සමෘද්ධිය මැනවින් විස්තර කෙරෙන සන්දේශ කාව්‍යය නම් කරන්න. (ලකුණු 02)


(2) මේ යුගයේ සාහිත්‍ය ප්‍රබෝධයට මුල් වූ ආගමික සිද්ධස්ථාන හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(3) "සිංහල සාහිත්‍යයේ දියුණුතම අවධිය කෝට්ටේ යුගයයි." උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) (1) යුරෝපා ඉතිහාසය ඉගෙනීමේ පහසුව සඳහා යුග තුනකට බෙදා දක්වයි. එම යුග තුනෙන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) a. ක්‍රි.ව. 313 දී ක්‍රිස්තු භක්තිකයන්ගේ ආධාර ඇතිව අධිරාජ තනතුර දිනාගත් මෙම අධිරාජයා නම් කරන්න. (ලකුණු 02)

b. මෙතුමාගෙන් ක්‍රිස්තු භක්තිකයන්ට ඉටු වූ විශේෂ සේවය කුමක්දැයි ලියා දක්වන්න. (ලකුණු 02)



(3) යුරෝපයේ වැඩවසම් සමාජ ක්‍රමයේ විශේෂ ලක්ෂණ දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)